2. මහා හත්ථිපදෝපම සූත්‍රය

1 **මා** විසින් මෙසේ අසන ලදි. එක් කලෙක භාග්‍යයවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ , අනේපිඬු සිටිඳු කරවනලද ජේතවන නම් ආරාමයෙහි වාසය කරන සේක, එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි මහණෙනි" යි භික්ෂූන් ඇමතූසේක, ඒ භික්ෂූහු " ඇවැත්නි" යි ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දුන්හ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළ සේක.

2 ඇවැත්නි, යම්සේ පොළොව මතුපිට හැසිරෙන්නාවූ පා සහිත වූ සතුන්ගේ යම්කිසි පාදයෝ වෙත්ද , ඒ සියළු පාදයෝ ඇත්පියෙහි ඇතුළත්වීමට පැමිනෙත් ඇත්පිය මහත් බැවින් ඒ සියළු පාදයන් අතුරෙහි අග්‍ර යයි කියනු ලැබේ. ඇවැත්නි, එපරිද්දෙන්ම යම් මේ කුශල ධර්ම කෙනෙක් වෙත්ද ඒ සියල්ල චතුරාර්ය සත්‍ය ධර්මයෙහි සංග්‍රහයට යෙන් කවර සතරෙක්හිද යත්:– දුඃඛ ආර්ය සත්‍යයෙහි, දුඃඛ සමුදය ආර්ය සත්‍යයෙහි , දුඃඛ නිරෝධ ආර්ය සත්‍යයෙහි , දුඃඛ නිරෝධ ගාමිනී ආර්ය සත්‍යයෙහිය.

3 ඇවැත්නි, දුඃඛ ආර්ය සත්‍යය කවරේද? ජාතියද දුකය ජරාවද දුකය. මරණය ද දුකය, ශෝකය, වැලපීම, කායික දුක , මානසික දොම්නස , දැඩි ආයාස යන මොහු ද දුක්ය.[1] කැමති වූ යමක් නොලබානම් ඒද දුකය, සංක්ෂෙපයෙන් උපාදාන ස්කන්ධ පසම දුකය .

4 ඇවැත්නි, උපාදාන ස්කන්ධ පස කවරහුද? එනම්ඃ රූප උපාදාන ස්කන්ධය ය, වේදනා උපාදාන ස්කන්ධය ය, සංඥා උපාදාන ස්කන්ධය ය, විඥාන උපාදාන ස්කන්ධය ය, යන මොහුය .

5 ඇවැත්නි, රූප උපාදාන ස්කන්ධය කවරේද? සතර මහාභූතයෝද , සතර මහාභූතයන්ගේ උපාදාය රූපද යන මේය ඇවැත්නි, සතර මහාභූතයෝ කවරහුද? පඨවි ධාතුව, ආපෝ ධාතුව, තේජෝ ධාතුව, වායෝ ධාතුඩ යන මොහුය

6 ඇවැත්නි, **පඨවි ධාතුව** කවරේද? පඨවි ධාතුව අධ්‍යාත්මික (අභ්‍යන්තර) ද වන්නේය, බාහිරද වන්නේය ඇවැත්නි, අධ්‍යාත්මික (අභ්‍යන්තර) පඨවි ධාතුව කවරේද නමා පිළිබඳ ,

[1] 'සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මෙහිදී "අප්‍රියයන් හා එක්වීම සහ ප්‍රියයන්ගෙන් වෙන්වීම යන කාරනා දෙක සඳහන් නොකරයි MN 9 MN 141

තමා නිසා පවත්නා , තද පරුෂවූ සතර මහාභූතයන්ගෙන් හටගත් යම් ද්‍රව්‍යයක් වේද, එනම් කෙස්, ලොම් , නිය, දත් , සම්, මස්, නහර , ඇට, ඇටමිදුළු, වකුගඩුව, හදවත , අක්මාව, දලඹුව , බඩදිව , පපුමස, අතුනු , අතුනු බහන් , නොපැසුනු ආහාර , මල යන මේද , තමා තුලවූ කර්කශවූ තදවූ මහාභූතයන් නිසා හටගත් අන්‍යයවූ යම්කිසිවකුත් වේද, ඇවැත්නි, මේ අධ්‍යාත්මික (අභ්‍යන්තර) පඨවි ධාතුව යැයි කියනු ලැබේ

'යම් මේ අධ්‍යාත්මික (අභ්‍යන්තර) පඨවි ධාතුවකුත් වේද, යම් බාහිර පඨවි ධාතුවකුත් වේද, ඒ සියල්ල පඨවි ධාතුවමය , මේ පඨවි ධාතුව මගේ නොවෙයි , මම තෙල පඨවි ධාතුයෙම් නොවෙමි, පඨවි ධාතුව මගේ ආත්මය නොවේ, යි මෙසේ මෙය සම්‍යයක් ප්‍රඥාවෙන් තත්වූ පරිදි දැක්ක යුතුය මෙසේ මෙය තත්වූ පරිදි සම්‍යයක් ප්‍රඥාවෙන් දැක පඨවි ධාතුවෙහි උකැටි වෙයි (කලකිරෙයි) පඨවි ධාතුවෙන් සිත බැහැර කෙරෙයි

7 යම් හෙයකින් බාහිර ආපෝ ධාතුව කිපේද එබඳු කාලයක් වේමය එකල්හි බාහිර පඨවි ධාතුව අතුරුදහන් වූයේ වෙයි ඇවැත්නි බහුලත්වයෙන් ඒසා (කෙළ සිය දහසක් පමණ) මහත්වූ ඒ බාහිර පඨවි ධාතුවේ ද අනිත්‍යය භාවය පෙනෙයි , ක්ෂය ස්වභාවය පෙනෙයි. ව්‍යාය ස්වභාවය පෙනෙයි වෙනස්වන ස්වභාවය ඇතිබව පෙනෙයි. 'කිම? ඔහුට මේ මඳ කලක් පවත්නාවූ , තෘෂ්ණාවෙන් දැඩිව ගන්නාලද්දාවූ , අධ්‍යත්මික ශරීරය පිළිබඳව 'මම ය' කියා හෝ 'මාගේ ය' කියා හෝ 'මම වෙමි'යි කියා හෝ ගැනීමක් වේද? තිලකුණු නගා බලන ඒ මහණහට මෙහි තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගැනීමක් නොවේමය .

8 ඇවැත්නි ඒ මහණහට අන්‍යයයෝ ආක්‍රෝශ කෙරෙත් ද පරිභව කෙරෙත් ද ගටත් ද වෙහෙසත් ද හෙතෙම මෙසේ දනියි. 'මට මේ ගොත්‍ර (ඝ්‍රාණ ඉන්ද්‍රිය) සංස්පර්ශයෙන් හටගත් දුක්ඛ වේදනාව උපන්නීය. ඕ වනාහී හේතුවක් නිසා උපන්නීය. හේතුරහිතවනො උපන්නීය. කුමක් හේතුකොට ද යත්: ස්පර්ශය හේතුකොට ගෙනය. හෙතෙම 'ස්පර්ශය අනිත්‍යය' යැයි දකියි. 'වේදනාව අනිත්‍යය' යැයි දකියි. 'සංඥාව අනිත්‍යය' යැයි දකියි. 'සංස්කාරයෝ අනිත්‍යය' යැයි දකියි. 'විඥාණය අනිත්‍යය' යැයි දකියි. ඔහුගේ සිත ධාතු සංඛ්‍යාත ආලම්බනයටම බසී. ඒ අරමුණෙහිම පහදියි. ඒ අරමුණෙහි ම සිටියි. ඒ අරමුණෙහි ධාතු වශයෙන් ම නිශ්චයට පැමිණෙයි.

ඇවැත්නි, ඉදින් ඒ මහණහට අන්‍යයයෝ අතිටු වූ නොකැමැති වූ, මන නොවඩන්නා වූ අතුල් පහරින් ද, කැට කැබිලිති පහරින් ද ,දඬු පහරින් ද, සැත් පහරින් ද , ගසත් නම් හෙතෙම මෙසේ දනියි. : "යම්බඳු කයක අත් පහර වදිද , කැට පහර වදිද, දඬු පහර වදිද , සැත් පහර වදිද , මේ කය එසේ වූයේය' භාග්‍යයවතුන් වහන්සේ විසින් කාකච්චූපම[3] ඔවාදයේදී මෙය වදාරණ ලදි: 'මහණෙන ලමුකම් ඇති හොරු දෙබිඩි කියත[2]කින් අඟ පසඟ කපත් ද ඒ

[3] 'කාකච්චූපම සූත්‍රය MN21

[4] Saw with two handles for two persons to saw logs (දෙදෙනෙක් අල්ලා දෙකකින් අල්ලා භාවිතා කරන දික් කියත)

සොරුන් කෙරෙහි ද යමෙක් සිත ප්‍රදූෂ්‍යය කරන්නේනම් හෙතෙම එයින් මාගේ අනුශාසනය ගරු කරන්නෙක් නොවේය' කියායි. මා විසින් වීර්යය පටන්ගන්නා ලද්දේ නොහැකිළුනේ වන්නේය. සිහිය එළඹ සිටියේ නොමුළාය. කය සන්හිඳුනේ පහවූ දරථ ඇත්තේය. සිත සමාහිත වූයේ එකඟය, දැන් කැමතිසේ මේ ශරීරයෙහි අතුල් පහස්හු වදින්වා , කැට පහස්හුද වදින්වා, දඬු පහස්හු ද වදින්වා, සැත් පහස්හු ද වදින්වා එහෙත් බුදුන්ගේ මේ ශාසනය කරනු ලැබේමය. (බුදුන් වහන්සේගේ අනුසාසනා පිළිපදින්නෙමි)

10 ඇවැත්නි, ඉදින් මෙසේ බුදුන් සිහිකරන මෙසේ ධර්මය සිහිකරන මෙසේ සංඝයා, සිහිකරන මහණහට කුසලනිःශ්‍රිත වූ විදශීනෝපේක්ෂාව නොපිහිටා ද, හෙතෙම එයින් සංවිග්න[3] (කම්පිත) වෙයි. සංවේගයට පැමිනෙයි. "මෙසේ බුදුන් සිහිකරන, මෙසේ ධර්මය සිහිකරන ,මෙසේ සංඝයා සිහිකරන, යම් බඳුවූ මට කුශල නිශ්‍රිත උපේක්ෂාව නොපිහිටා ද ඒ මට ඒකාන්තයෙන් අලාභය. මට ඒකාන්තයෙන් ලාභ නොවෙයි මාගේ ලැබීම නොමනාය. මාගේ ලැබීම යහපත් නොවේ" යි කියායි.

11 ඇවැත්නි, යම්සේ ලේලිය මයිලනුවන් දැක සංවිග්න වෙයි[4] ද සංවේගයට පැමිනෙයි ද ඇවැත්නි, මෙසේ බුදුන් සිහිකරන, මෙසේ ධර්මය සිහිකරන, මෙසේ සංඝයා සිහිකරන, ඒ මහණ හට කුශල නිශ්‍රිත උපේක්ෂාව නොපිහිටා ද, හෙතෙම එයින් සංවිග්න වෙයි සංවේගයට පැමිනෙයි : මෙසේ බුදුන් සිහිකරන, මෙසේ ධර්මය සිහිකරන, මෙසේ සංඝයා සිහිකරන, යම් බඳුවූ මට කුශල නිශ්‍රිත උපේක්ෂාව නොපිහිටා ද, ඒ මට ඒකාන්තයෙන් අලාභය මට ඒකාන්තයෙන් ලාභ නොවෙයි. මාගේ ලැබීම නොමනාය මාගේ ලැබීම යහපත් නොවේ"

12 ඇවැත්නි, ඉදින් මෙසේ බුදුන් සිහිකරන මෙසේ ධර්මය සිහිකරන මෙසේ සංඝයා, සිහිකරන මහණහට ඉදින් කුසලනිःශ්‍රිත වූ විදශීනෝපේක්ෂාව පිහිටානම් හෙතෙම එයින් සතුටු වෙයි. ඇවැත්නි මේ පමනකින් ඒ මහණහු විසින් බුද්ධ ශාසනය බොහෝකොට කරන ලද වෙයි.

13 ඇවැත්නි, **ආපෝ ධාතුව** කවර? ආපෝ ධාතුව අධ්‍යාත්මික ද (අභ්‍යන්තර)වන්නේය. බාහිරද වන්නේය. ඇවැත්නි, අධ්‍යාත්මික ආපෝ ධාතුව කවර යත්:– අධ්‍යාත්ම වූ ප්‍රත්‍යාත්ම වූ භූතයන් නිසා හටගත් යම් (ආබන්ධන ලක්ෂණ) ආපයෙක් ආපෝගතයෙක් වේද : ඒ මෙසේය පිත, සෙම, සැරව, ලේ, දහදිය, මේද, තෙල්, කඳුළු, වුරුනු තෙල්, කෙළ, සොටු, සඳ මිදුළු, මුත්‍රා යන මොහුය. තමා තුල පිහිටි ආබන්ධන ලක්ෂණ වූ ආපෝ බවට ගිය, මහාභූතයන් නිසා හටගත්, යම් අන් කිසිවකුත් වේද, ද්‍රව්‍යයක් වේද, ඇවැත්නි, මෙය අජ්ඣත්තික ආපෝ ධාතුවය යි කියනු ලැබේ ඇවැත්නි, යම් මේ අධ්‍යාත්මික ආපෝ ධාතුවක් වේද, යම් බාහිර ආපෝ ධාතුවකුත් වේද, මේ සියල්ල ආපෝ ධාතු මය, 'මේ මාගේ නොවේ මේ මම නොවෙමි මේ මගේ ආත්මය නොවේය' යි

[5] Comes to a feeling of Urgency
[6] Get a feeling of urgency to please Father in Law

මෙය මෙසේ තත්වූ පරිදි සම්‍යයක් ප්‍රඥාවෙන් දැක්ක යුතුය. මෙසේ එය තත්වූ පරිදි, සම්‍යයක් ප්‍රඥාවෙන් දැක, ආපෝ ධාතුවෙහි කලකිරෙයි ආපෝ ධාතුවෙහි සිත නොරඳවයි.

14 ඇවැත්නි, යම් හෙයකින් බාහිර ආපෝ ධාතුව කිපේද, එබඳුවූ කාලයක් වේමය[7]. එය ගම්ද උගුලා වනසා යයි, නියම් ගම්ද ද උගුලා වනසා යයි, නගරද උගුලා වනසා යයි, දනවුද උගුලා වනසා යයි, දනව් පෙදෙස් ද උගුලා වනසා යයි, ඇවැත්නි, මහ මුහුද යොදුන් සියයයක් පමණ තැන් ජලය සිඳී යේද, යොදුන් දෙසියකුත් ජලය සිඳී යේද, යොදුන් තුන්සයියකුත් ජලය සිඳී යේද, යොදුන් හාරසියකුත් ජලය සිඳී යේද, යොදුන් පන්සියකුත් ජලය සිඳී යේද, යොදුන් හයසියකුත් ජලය සිඳී යේද, යොදුන් සත්සියකුත් ජලය සිඳී යේද එබඳු කාලයෙක් වෙයි.

ඇවැත්නි, යම් කලෙක මහ මුහුදෙහි ජලය සත්තලක් පමණ සිටීද, සතලක් පමණ සිටීද, පස්තලක් පමණ සිටීද, සිවු තලක් පමණ සිටීද, තුන් තලක් පමණ සිටීද, දෙතලක් පමණ සිටීද, එක් තලක් පමණ සිටීද, එවැනි කාලයක් වේය.

'ඇවැත්නි, යම් කලෙක මහ මුහුදෙහි පුරුෂ ප්‍රමාණ සතක් ජලය සිටීද, පුරුෂ ප්‍රමාණ සයක් ජලය සිටීද, පුරුෂ ප්‍රමාණ පහක් ජලය සිටීද, පුරුෂ ප්‍රමාණ සතරක් ජලය සිටීද, පුරුෂ ප්‍රමාණ තුනක් ජලය සිටීද, පුරුෂ ප්‍රමාණ දෙකක් ජලය සිටීද, පුරුෂ ප්‍රමාණයක් ජලය සිටීද, එබඳු කාලයෙක් වේමය.

'ඇවැත්නි, යම් කලෙක මහ මුහුදෙහි අඩි පුරුෂ ප්‍රමාණයක් ජලය සිටීද, කටිය පමණ ජලය සිටීද, දණ පමණ ජලය සිටීද, ගොප් ඇටය පමණ ජලය සිටීද, එබඳුවූ කාලයෙක් වේමය. ඇවැත්නි යම් කලෙක මහ මුහුදෙහි ඇඟිලි පුරුක තෙමෙන ජලය නොවේද, එබඳුවූ කාලයෙක් වේමය. ඇවැත්නි එපමණ මහත්වූ ඒ බාහිර ආපෝ ධාතුවෙහි අනිත්‍යතා පෙනෙන්නේය.....[8]

15 ඇවැත්නි, මෙසේ බුදුන් සිහිකරන, මෙසේ ධර්මය සිහිකරන, මෙසේ සංඝයා සිහිකරන, ඒ මහණහට ඉදින් කුශල නිඃශ්‍රිතවූ උපෙක්ෂාව පිහිටාද හෙතෙම එයින් සතුටු වෙයි 'ඇවැත්නි මෙපමණකිනුත් මහණවු විසින් බුදධ ශාසනය බොහෝ කොට කරණ ලද්දේ වෙයි

16 ඇවැත්නි, **තේජෝ ධාතුව** කවර? තේජෝ ධාතුව අජ්ඣත්තික ද (අභ්‍යන්තර)වන්නේය. බාහිරද වන්නේය. ඇවැත්නි, අජ්ඣත්තික තේජෝ ධාතුව කවර යත්:- තමා පිළිබඳව තේජසවූ තේජස්බවට ගියාවූ (මම ය මාගේ යයි) තරව ගත් නාලද[7] යමක් වේද – එනම්: යමකින් තැවේ ද යමකින් දිරා ද යමකින් දැවේ ද අනුභව කරන ලද පාණය කරන ලද කඩා කන ලද රස විඳින ලද දේ යමෙකින් මැනැවින් පැසීමට යේද එයින් අන්‍යවූ තමා නිසා පවත්නාවූ තේජසවූ තේජස්බවට ගියාවූ තරව ගන්නා ලද්දාවූ යම් කිසිවකුත් වේද – ඇවැත්නි මෙය

---

[7] Floods, Tsunamies etc

[8] .මෙහි පෙය්‍යාලයෙන් වැසුනු කොටස පඨවිධාතුවාරයෙහි කී නයින් දතයුතු

[9] .මෙහි සෙසු වාරයන්හි ද 'උපාදිනනං" – පදයට මේ අර්ථය ගතයුතු

අජ්ඣත්තික තේජෝ ධාතු යයි කියනු ලැබේ ඇවැත්නි මේ අජ්ඣත්තික තේජෝ ධාතුවක් වේද යම් බාහිර තේජෝ ධාතුවක් වේද එය තේජෝ ධාතුමය 'එය මාගේ නොවෙයි මම නෙල නොවෙමි එය මාගේ ආත්මය නොවෙයි – මේ මෙසේ තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දැක්ක යුතුය මෙසේ මෙය තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් දැක තේජෝ ධාතුවෙහි කලකිරෙයි තේජෝ ධාතුවෙහි සිත නොඇලවයි

17 ඇවැත්නි, යම් කලෙක බාහිර තේජෝ ධාතුව කිපේ ද එබඳු කාලයෙක් වේමය. එය ගම්ද දවයි, නියම් ගම්ද දවයි, නගරද දවයි, ජනපද ද දවයි, දනව් පෙදෙස් ද දවයි, ඒ තේජෝ ධාතුව නිල් තෙත් තණ වෙතට හෝ මහ මගට හෝ පව්වකට හෝ දියකට හෝ එළිමහන් බිම් පෙදෙසකට හෝ පැමිණ ආහාර රහිත වූයේ නිවෙයි ඇවැත්නි, යම් කලෙක කුකුළු පියාපතෙහි ඇටයකින් ද සම් වැරලියෙන් ද ගිනි සොයන්නම්[10] එබඳු කාලයක් වේමය ඇවැත්නි එපමණ මහත්වූ ඒ බාහිර තේජෝ ධාතුවෙහි අනිත්‍ය භාවයක් පෙනෙන්නේය...

18 ඇවැත්නි, මෙසේ බුදුන් සිහිකරන, මෙසේ ධර්මය සිහිකරන, මෙසේ සංඝයා සිහිකරන, ඒ මහණහට ඉදින් කුශල නිඃශ්‍රිතවූ උපෙක්ෂාව පිහිටාද හෙතෙම එයින් සතුටු වෙයි 'ඇවැත්නි මෙපමණකිනුත් මහණවූ විසින් බුදධ ශාසනය බොහෝ කොට කරණ ලද්දේ වෙයි

19 ඇවැත්නි, **වායෝ ධාතුව** කවර? වායෝ ධාතුව අජ්ඣත්තික ද (අභ්‍යන්තර)වන්නේය. බාහිරද වන්නේය. ඇවැත්නි, අජ්ඣත්තික වායෝ ධාතුව කවර? තමා තුළ පවත්නාවූ වාතයවූ වාත ස්වභාවයට ගියාවූ මහා භූතයන් නිසා හටගන්නාවූ යමක් වේද – එනම්: තැලි නැගීම් හික්කා ආදිය පවත්වන උඩට නගින වාතයෝද මල මූ ආදිය පවත්වන යට බස්නා වාතයෝද අතුනු පිටත පවත්නා වාතයෝද අතුනු තුළ පවත්නා වාතයෝද අඟ පසඟ හැසිරෙන වාතයෝද ආශ්වාසය ප්‍රශ්වාසය යන වාතයෝද මෙයින් අන්‍යයවූ තමා තුළ පවත්නාවූ වාතය වූ වාත ස්වභාවයට ගියාවූ භූතයන් නිසා හටගන්නාවූ යම් කිසිවකුත් වේද– ඇවැත්නි, මෙය අජ්ඣත්තික වායෝ ධාතුවයැයි කියනු ලැබේ යම් අභ්‍යන්තර වායෝ ධාතුවක් වේද යම් බාහිර වායෝ ධාතුවකුත් වේද මේ වායෝ ධාතුව මය, 'මේ මාගේ නොවේ මේ මම නොවෙමි මේ මගේ ආත්මය නොවේය' යි මෙය මෙසේ තත්වූ පරිදි සම්‍යයක් ප්‍රඥාවෙන් දැක්ක යුතුය. මෙසේ එය තත්වූ පරිදි, සම්‍යයක් ප්‍රඥාවෙන් දැක, වායෝ ධාතුවෙහි කලකිරෙයි වායෝ ධාතුවෙහි සිත නොරඳවයි.

20 ඇවැත්නි, යම් කලෙක බාහිර වායෝ ධාතුව කිපේ ද එබඳු කාලයෙක් වේමය. එය ගම්ද නගාලයි, නියම් ගම්ද නගාලයි, නගරද නගාලයි, ජනපද ප්‍රදේශයන්ද නගාලයි.

---

[10] AN 7.46 (quoted in *The Mind Like Fire Unbound*) cites a wing bone and tendon parings as examples of items that will not catch fire. Perhaps the passage was meant as a comical parody of someone who, having seen another person start fire with a fire stick, tried to imitate that person without understanding the basic principle involved. If you used a fire stick and wood shavings, you would get fire. If you used a wing bone instead of a fire stick, and tendon parings instead of wood shavings, you wouldn't.- *Ven Thanissaro*

ඇවැත්නි යම් කාලයෙක්හි ගිම්හානයේ අන්තිම මාසයේ දී තල් වැටිනුත් විජිනිපතිනුත් වාතය සොයන්ද සෙවෙනි අගත් තණ නොසැලේද එබඳු කාලයක් වේමය ඇවැත්නි එපමණ මහත්වූ වායෝ ධාතුවෙහි අනිත්‍යභාවය ප්‍රකට වන්නේය විනාශ භාවය ප්‍රකට වන්නේය විපරිනාම ස්වභාවය ප්‍රකට වන්නේය ස්වල්ප කාලයක් පවත්නාවූ තණ්හාවෙන් අල්ලා ගන්නා ලද්දාවූ මේ ශරීරය පිළිබඳව 'මේ මම ය කියා හෝ මේ මාගේය කියා හෝ මම වෙමි කියා හෝ ගැනීමෙක් කිම? ඕහට වන්නේද? ඒ මහණහට මෙහි තණ්හා මාන දිට්ඨි වශයෙන් ගැනීමක් නොවේමය

21 ඇවැත්නි ඒ මහණහට අන්‍යයයෝ ආක්‍රෝශ කෙරෙත් ද පරිභව කෙරෙත් ද ගටත් ද වෙහෙසත් ද හෙතෙම මෙසේ දනියි. 'මට මේ ගොත්‍ර (ඝ්‍රාණ ඉන්ද්‍රිය) සංස්පර්ශයෙන් හටගත් දුක්ඛ වේදනාව උපන්නීය. මේ වනාහී හේතුවක් නිසා උපන්නීය. හේතු රහිතව නො උපන්නීය. කුමක් හේතුකොට ද යත්: ස්පර්ශය හේතුකොට ගෙනය. හෙතෙම 'ස්පර්ශය අනිත්‍යය' යැයි දකියි. 'වේදනාව අනිත්‍යය' යැයි දකියි. 'සංඥාව අනිත්‍යය' යැයි දකියි. 'සංස්කාරයෝ අනිත්‍යය' යැයි දකියි. 'විඥාණය අනිත්‍යය' යැයි දකියි. ඔහුගේ සිත ධාතු සංඛ්‍යාත ඒ අරමුණෙහිම බසී. ඒ අරමුණෙහිම පහදියි. ඒ අරමුණෙහි ම සිටියි. ඒ අරමුණෙහි 'ධාතු වශයෙන් මෙසේය' නිශ්චයට පැමිණෙයි.

22 ඇවැත්නි, ඉදින් ඒ මහණහට අන්‍යයයෝ අනිටු වූ නොකැමැති වූ, මන නොවඩන්නා වූ අතුල් පහරින් ද, කැට කැබිලිති පහරින් ද ,දඬු පහරින් ද, සැත් පහරින් ද , ගසත් නම් හෙතෙම මෙසේ දනියි. : "යම්බඳු කයක අත් පහර වදිද , කැට පහර වදිද, දඬු පහර වදිද , සැත් පහර වදිද , මේ කය එසේ වූයේය' භාග්‍යයවතුන් වහන්සේ විසින් කාකච්චූපම ඔවාදයේදී මෙය වදාරණ ලදි: 'මහණෙන ලමුකම් ඇති හොරු දෙබිඩි කියතකින් අඟ පසඟ කපත් ද ඒ සොරුන් කෙරෙහි ද යමෙක් සිත ප්‍රදූෂ්‍යය කරන්නේනම් හෙතෙම එයින් මාගේ අනුශාසනය ගරු කරන්නෙක් නොවේය' කියායි. මා විසින් වීර්යය පටන්ගන්නා ලද්දේ නොහැකිළෙන් වන්නේය. සිහිය එළඹ සිටියේ නොමුළාය. කය සන්හිඳුනේ පහවූ දරථ ඇත්තේය. සිත සමාහිත වූයේ එකඟය, දැන් කැමතිසේ මේ ශරීරයෙහි අතුල් පහස්හු වදින්වා , කැට පහස්හුද වදින්වා, දඬු පහස්හු ද වදින්වා, සැත් පහස්හු ද වදින්වා එහෙත් බුදුන්ගේ මේ ශාසනය කරනු ලැබේමය.

23 ඇවැත්නි, මෙසේ බුදුන් සිහිකරන, මෙසේ ධර්මය සිහිකරන, මෙසේ සංඝයා සිහිකරන, ඒ මහණහට ඉදින් කුශල නිශ්‍රිතවූ විදර්ශනොපෙක්ෂාව නොපිහිටා ද, හෙතෙම එයින් කලකිරෙයි. සංවේගයට පැමිනෙයි. "මෙසේ බුදුන් සිහිකරන, මෙසේ ධර්මය සිහිකරන ,මෙසේ සංඝයා සිහිකරන, යම් බඳුවූ මට කුශල නිශ්‍රිත උපේක්ෂාව නොපිහිටා ද ඒ මට ඒකාන්තයෙන් අලාභය. මට ඒකාන්තයෙන් ලාභ නොවෙයි මාගේ ලැබීම නොමනාය. මාගේ ලැබීම යහපත් නොවේ" යි කියායි.

[11] Saw with two handles for two persons to saw logs (දෙදෙනෙක් අල්ලු දෙකකින් අල්ලා හාවිතා කරන දික් කියත)

24 ඇවැත්නිල යම්සේ ලේලිය මයිලණුවන් දැක බියපත් වේද සංවේගයට පැමිණේද මෙසේ බුදුන් සිහිකරන, මෙසේ ධර්මය සිහිකරන ,මෙසේ සංඝයා සිහිකරන, ඒ මහණ හට කුශල නිःශ්‍රිතවූ උපෙක්ෂාව නොපිහිටාද හෙතෙම එයින් කළකිරෙයි. සංවේගයට පැමිනෙයි. "මෙසේ බුදුන් සිහිකරන, මෙසේ ධර්මය සිහිකරන ,මෙසේ සංඝයා සිහිකරන, යම් බඳුවූ මට කුශල නිශ්‍රිත උපේක්ෂාව නොපිහිටා ද, ඒ මට ඒකාන්තයෙන් අලාභය. මට ඒකාන්තයෙන් ලාභ නොවෙයි, මාගේ ලැබීම නොමනාය. මාගේ ලැබීම යහපත් නොවේ" යි කියායි.

25 ඇවැත්නි, ඉදින් මෙසේ බුදුන් සිහිකරන, මෙසේ ධර්මය සිහිකරන, මෙසේ සංඝයා සිහිකරන, ඒ මහණහට ඉදින් කුශල නිःශ්‍රිත වීර්‍යබල භාවනා සිදධ ෂඩඞ්ග උපෙක්ෂාව පිහිටාද, හෙතෙම එයින් සතුටු වෙයි. 'ඇවැත්නි මෙපමණකිනුත් ද, ඒ මහණවූ විසින් බුදධ ශාසනය බොහෝ කොට කරණ ලද්දේ වෙයි.

26 ඇවැත්නි, යම්සේ දැව නිසා ද, වැල් නිසා ද ;තණ නිසා ද, මැටි නිසා ද ඇවිරී සිටි අහස 'ගෙය' යි ව්‍යාවහාරයට යේ ද, ඇවැත්නි, මෙපරිද්දෙන්ම ඇට නිසා, නහර නිසා, මස් නිසා, සම් නිසා ඇවිරී සිටි අහස (අවකාශය') 'රූපය' යි ව්‍යාවහාරයට යේ.

ඇවැත්නි, ඉදින් අධ්‍යාත්මික වූ ඇස නොබිඳුනේ වේ නම්, බාහිර රූපයෝත් ඇස් හමුවට නොපැමිනෙත් නම්, එයින් උපදනා (ඇසත් රූපයත් නිසා) මනසිකාරය, (මෙනෙහිකිරීම) නොවේ නම් ඒ තාක් ඊට අනුරූපවූ විඥාන භාගයාගේ පහළවීම නොවෙයි. ඇවැත්නි, අධ්‍යාත්මික වූ චක්ෂුඃප්‍රසාදය නොබිඳුනේ වේද, බාහිර රූපයෝත් ඇස් හමුවට පැමිනෙත් ද, (එහෙත්) ඊට අනුරූපවූ මෙනෙහිකිරීම නොවේනම්, ඒ තාක් තදානුරූපවූ චක්ෂු විඥානයාගේ පහළවීම නොවේමය. ඇවැත්නි, යම් හෙයකින් අධ්‍යාත්මික වූ චක්ෂුඃප්‍රසාදය නොබිඳුනේ වේද, බාහිර රූපයෝත් ඇස් හමුවට පැමිනෙත් ද, ඊට අනුරූපවූ මෙනෙහිකිරීමත් වේද, මෙසේ ඊට සුදුසු විඥානයාගේ පහළවීම වෙයි. ඒ චක්ෂු විඥානය සමග වූවහුගේ (ඒ විඥානවිෂය වූ) යම් රූපයක් වේද, එය රූපොපාදාන සකන්ධයෙහි ඇතුළත්බවට යෙයි. ඒ විඥාන සමංගී වූවහුගේ යම් වේදනාවක් වේද, එය වේදනොපාදනස්කන්ධයෙහි ඇතුළත්බවට යෙයි. එබඳු වූවහුගේ (ඒ විඥාන සම්ප්‍රයුක්ත) යම් සංඥාවක් වේද, එය සංඥෝපාදාන සකන්ධයෙහි ඇතුළත්බවට යෙයි. එබඳු වූවහුගේ (ඒ විඥාන සම්ප්‍රයුක්ත) යම් චෙතනා සංස්කාරයෝ වේද, එය සංස්කාරෝපාදාන සකන්ධයෙහි ඇතුළත්බවට යෙයි. එබඳු වූවහුගේ යම් විඥානයෙක් වේද, (චක්ෂුර් විඥානය) එය විඥානෝපාදානස්කන්ධයෙහි ඇතුළත්බවට යෙයි

හෙතෙම මෙසේ දනියි. "මෙසේ මේ පස් වැදැරුම්වූ උපාදානස්කන්ධයන්ගේ සංග්‍රහය සන්නිපාතය එක් රැස්වීම වෙයි. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින්ද වදාරණලදි: 'යමෙක් පටිචච සමුප්පාදය දකීද හෙතෙම (පටිචච සම්පන්නවූ) ධර්මය දකියි යමෙක් ධර්මය දකීද හෙතෙම පටිචච සමුප්පාදය දකියි' කියායි.

මේ උපාදානස්කන්ධ පසෙහි යම් වන්දයෙක් ආලයෙක් සෙනහයෙක් ගැලී සිටීමක් වේද එය දුක්ඛ සමුදය යි. මේ උපාදානස්කන්ධ පසෙහි යම් වන්දරාග විනයෙක් වේද ඡන්දරාග ප්‍රහාණයක් වේද එය දුක්ඛ නිරෝධය" යි කියායි. ඇවැත්නි මෙපමණකිනුත් ද ඒ මහණවූ විසින් බුදධ ශාසනය බොහෝ කොට කරණ ලද්දේ වෙයි.

27 "ඇවැත්නි, අධ්‍යාත්මික වූ ශ්‍රොත්‍ර ප්‍රසාදය නොබිඳුනේ වේ නම් , බාහිර ශබ්දයෝත් ආපාථයට පැමිණෙත්නම් ..... ඇවැත්නි, අධ්‍යාත්මික වූ ශ්‍රොත්‍ර ප්‍රසාදය නොබිඳුනේ වේ නම් , බාහිර ශබ්දයෝත් ආපාථයට නොපැමිණෙත්නම් .....ඇවැත්නි, අධ්‍යාත්මික වූ ඝ්‍රාන ප්‍රසාදය නොබිඳුනේ වේ නම් , බාහිර ගන්ධයෝත් ආපාථයට නොපැමිණෙත්නම් ..... ඇවැත්නි, අධ්‍යාත්මික වූ ජිව්හා ප්‍රසාදය නොබිඳුනේ වේ නම් , බාහිර රසයෝත් ආපාථයට නොපැමිණෙත්නම් ..... ඇවැත්නි, අධ්‍යාත්මික වූ කාය ප්‍රසාදය නොබිඳුනේ වේ නම් , බාහිර ස්පර්ශයෝත් ආපාථයට නොපැමිණෙත්නම් ..... ඇවැත්නි, අධ්‍යාත්මික වූ මනස නොබිඳුනේ වේ නම් , බාහිර ධර්මයෝත් ආපාථයට නොපැමිණෙත්නම් ඊට අනුරූප වූ මෙනෙහි කිරමත් නොවේ නම් ඒනාක් ඊට අනුරූපවූ විඥානයාගේ පහළවීම නොවේ.

ඇවැත්නි, ඉදින් අධ්‍යාත්මික වූ සිත නොබිඳුනේ වේද බාහිර ධර්මයෝත් ආපාථයට පැමිණෙත්ද එහෙත් ඊට අනුරූපවූ මෙනෙහි කිරීම නොවේ නම් ඒනාක් ඊට අනුරූපවූ විඥානයාගේ පහළවීම නොවේ–

ඇවැත්නි, ඉදින් යම් හෙයකින් අධ්‍යාත්මික වූ සිත නොබිඳුනේ වෙ නම් බාහිර ධර්මයෝත් ආපාථයට එත්නම් ඉන් උපදනාවූ හෝ ඊට අනුරූපවූ මෙනෙහි කිරීමත් වේ නම් මෙසේ ඊට අනුරූපවූ විඥානභාගයාගේ පහළවීම වේ. එබඳු වූවහුගේ යම් රූපයක් වේද එය රූපෝදානස්කන්ධයෙහි සංග්‍රහයට යේ. එබඳු වූවහුගේ යම් වේදනාවක් වේද එය වේදනෝපාදානස්කන්ධයෙහි සංග්‍රහයට යේ. එබඳු වූවහුගේ යම් සංඥාවක් වේද එය සංඥෝපාදානස්කන්ධයෙහි සංග්‍රහයට යේ. එබඳු වූවහුගේ යම් සංස්කාරයෝ වෙත්ද එය සංස්කාරෝපාදානස්කන්ධයෙහි සංග්‍රහයට යේ. එබඳු වූවහුගේ යම් විඥානයෙක් වේද එය විඥානෝපාදානස්කන්ධයෙහි සංග්‍රහයට යේ. හෙතෙම මෙසේ දනියි.

"මේ පස් වැදැරුම් උපාදානස්කන්ධයන් කෙරෙහි වූ තණ්හාවගේ යම් දුරුකිරීමක් වේ ද, තණ්හාවගේ යම් නැතිකිරීමක් වේ ද, එය දුක් නැති කිරීමයි. ඇවැත්නි, මෙපමණින් ද මහණහු විසින් බොහෝ සෙයින් බුද්ධානුශාසනය කරන ලද්දේ වෙයි.

"ඇවැත්නි, ආධ්‍යාත්මික වූ මනෝවිඤ්ඤාණය නොනැසුනේ වේ ද ,බාහිර ධර්ම අරමුණු සිත හමුවට පැමිණෙද්ද, ඊට අනුකූල වූ මනසිකාරය නොවෙයි ද, ඒ නාක් ඊට අනුරූප විඥාන කොට්ඨාසයාගේ පහළවීම නොවෙයි.

"ඇවැත්නි, අධ්‍යාත්මික වූ මනොවිඤ්ඤාණය නොනැසුනේ වේ ද , බාහිර ධර්ම අරමුණු සිත හමුවට පැමිණෙද්ද, ඊට අනුකූලවූ මනසිකාරය නොවෙයිද, ඒ තාක් ඊට අනුරූප විඥාන කොට්ඨාසයාගේ පහළවීම නොවෙයි.

"ඇවැත්නි, අධ්‍යාත්මික වූ මනොද්වාරය නොනැසුනේ වේ ද, බාහිර ධර්ම අරමුණු සිත හමුවට පැමිණෙද්ද, ඊට අනුකූලවූ මනසිකාරය වෙයි ද එකල්හි ඊට අනුරූප විඥාන කොට්ඨාසයාගේ පහළවීම වෙයි. ඒ මනොවිඤ්ඤාණය සමග යම් රූපයක්වේ ද, එය රූප උපාදානස්කන්ධයෙහි ඇතුලත් වෙයි. ඒ මනොවිඤ්ඤාණය සමග යම් වේදනාවක් වේද, එය වේදනා උපාදානස්කන්ධයෙහි ඇතුලත් වෙයි.ඒ මනොවිඤ්ඤාණයත් සමග යම් සංඥාවක් වේද, එය සංඥා උපාදානස්කන්ධයෙහි ඇතුලත් වෙයි,ඒ මනොවිඤ්ඤාණය සමග යම් සංස්කාරයෝ වෙත්ද, ඔවුහු සංස්කාර උපාදානස්කන්ධයෙහි ඇතුලත් වෙත්. ඒ මනොවිඤ්ඤාණය සමග යම් විඥානයක් වේද, එය විඥාන උපාදානස්කන්ධයෙහි ඇතුලත් වෙයි, ඔහු මෙසේ දනී. 'මේ පස්වැදැරුම් උපාදානස්කන්ධයන්ගේ සංග්‍රහය,එක්වීම, රැස්වීම වෙයි' (කියාය) භාග්‍යවතුන් වහන්සේ විසින් ද මෙසේ වදාරණ ලද්දේමය.

"යමෙක් පටිච්චසමුප්පාදය දකීනම් හෙතෙමේ ධර්මය දකි. යමෙක් ධර්මය දකීනම් හෙතෙමේ පටිච්චසමුප්පාදය දකීයයි" (වදාළහ).

"යම් මේ පස්වැදැරුම් උපාදානස්කන්ධයෝ වෙද්ද, මොහු ප්‍රත්‍යයෙන් (හේතුවෙන්) හටගන්නාහුමය. මේ පස්වැදැරුම් උපාදාන ස්කන්ධයන් කෙරෙහි යම් කැමැත්තක් වේ ද, යම් ඇලීමක් වේ ද, යම් අනුකූල බවක් වේ ද, යම් බලවත් ඇල්මක් වේ ද, එය දුක් ඉපදීමේ හේතුවයි.

"මේ පස්වැදැරුම් උපාදානස්කන්ධයන් කෙරෙහි වූ තණ්හාවගේ යම් දුරුකිරීමක් වේ ද, තණ්හාවගේ යම් නැතිකිරීමක් වේ ද, එය දුක් නැතිකිරීමයි. ඇවැත්නි මෙපමණින් ද භික්ෂුව විසින් බුද්ධානුශාසනය බොහෝ සෙයින් කරන ලද්දේ වෙයි[1]."

ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේගේ දේශනාව පිළිගත්හ.

අටවෙනි වූ මහාහත්ථිපදෝපම සූත්‍රය නිමි. (3 = 8)

---

[12] "මෙම සුප්‍රසිද්ධ පාඨය ත්‍රිපිටකයේ අන් කිසි තැනක දක්නට නොලැබේ

[13] ' අරහත් භාවය හෝ නිර්වාන මාර්ගය ලෙස නම් නොකලද කාම ආශ්‍රව දුරුකිරීම මාර්ගය සේ මෙහි හැඳින්වේ